# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1680/29 - 2010 නොවැම්බර් මස 19 වැනි සිකුරාදා - 2010.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2004 අංක 11 දරන මුදල් පනත**

2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් 2010 අංක 01 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීමේ) නියෝගවලට 2011.01.01 දින සිට බලපවත්වන පරිදි සිදු කරනු ලබන සංශෝධන.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ 4 වැනි නියෝගයට පසුව නියෝග 4(අ) ලෙස බලාත්මක වන පරිදි පහත සඳහන් නව නියෝග ඇතුළත් කෙරේ.

"4(අ) විශේෂිත දුරකථන අංක (වි.දු.අ) සඳහා එන ජාත්‍යන්තර ඇමතුම් සම්බන්ධයෙන් වන බද්ද I වැනි උපලේඛනයේ අ(i) වගුවෙහි දක්වා ඇති පරිදි අදාළ අනුප්‍රමාණවලින් හා අදාළ කාල පරිච්ඡේද සඳහා අයකළ යුතුය".

2. නියෝග 7 පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.
මෙම නියෝගයෙහි,

"උපලේඛන I හි ඇ වගුවේ දක්වා ඇති පරිදි අය කරන ලද වි.සං.සං.ගා." යන වචන වලට පසුව "සහ උපලේඛන I හි අ(i) වගුවේ දක්වා ඇති පරිදි අය කරන ලද වි.දු.අ.ගා." යන වචන ඇතුළත් විය යුතුය.

3. නියෝග 8 පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

1A - G 13796 — 930 (2010/11)

මෙම නියෝගයෙහි,

"ජාත්‍යන්තර දුරකථන ක්‍රියාකරුවන්ගෙන් උපලේඛන I ඇ වගුව යටතේ එක්රැස් කරන ලද" "වි.සං.සං.ගා" යන වචනවලට පසුව "සහ උපලේඛන I හි අ (i) වගුව යටතේ එක්රැස් කරන ලද වි.දු.අ.ගා" යන වචන ඇතුළත් විය යුතුය.

4. නියෝග 9 වෙනුවට පහත සඳහන් නව ඡේදය නියෝග 9 ලෙස ඇතුළත් විය යුතුය.

"යන ජාත්‍යන්තර ඇමතුම් සම්බන්ධයෙන් මෙහි මින් මතු යන දේශීය ප්‍රවේශ ගාස්තු (ය.දේ.ප්‍ර.ගා.) යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ බද්ද මේ නියෝගවල I උපලේඛනයේ වගුව ඇ හි දක්වා ඇති කාල සීමාව සඳහා සහ එසේ සඳහන් අනුප්‍රමාණ අනුව විය යුතුය".

5. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ 9 වැනි නියෝගයට පසුව නියෝග 9(අ) ලෙස බලාත්මක වන පරිදි පහත සඳහන් නව නියෝග ඇතුළත් කෙරේ.

"9(අ) පළමු උපලේඛනයේ වගුව ඈ යටතේ එක්රැස් කරන ලද, ය.දේ.ප්‍ර.ගා. නියෝග 11 දක්වා ඇති පරිදි ප්‍රසිද්ධ කරන ලද නියමිත දිනයෙන් දින 15 ඉක්මයාමට මත්තෙන් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතුය".

6. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ I උපලේඛනයේ (ඉංග්‍රීසි පරිවර්තනයේ) B ලෙස හඳුන්වා ඇති තුන්වන වගුව C ලෙස සංශෝධනය විය යුතුය.

7. නියෝග 25 (අර්ථ නිරූපන) යටතේ සඳහන් පොලී ආදායම යන වචනය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

මෙම නියෝගයේ "පොලී ආදායම" යන්නෙන් "විදුලි සංදේශ සංවර්ධන ගාස්තු" යන වචනවලට පසුව "හා විශේෂිත දුරකථන අංක ගාස්තුව" යන්න ඇතුළත් විය යුතුය.

8. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ II උපලේඛනයේ "ඇමතුම් ආරම්භය" නැමති වගුවල තුන්වන කොළමයන් වන "දේශීය පොදු දුරකථන යතුරු පුවරු ජාල ක්‍රියාකරුට ගෙවන ලද යන දේශීය පිවිසුම් ඇමතුම් ගාස්තු ගෙවීම" සහ "එක් එක් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුගෙන් අය විය යුතු සහ යන දේශීය පිවිසුම් ඇමතුම් ගාස්තු ගෙවීම" ඉවත් කරනු ලැබේ.

9. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ I උපලේඛනයේ "එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු අනුපාත" අ වගුවට පසුව බලාත්මක වන පරිදි පහත සඳහන් අ(i) වගුව ඇතුළත් කෙරේ.

උපලේඛන I

*වගුව අ (i)*

*විශේෂිත දුරකථන අංක (වි.දු.අ.) සඳහා එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු බදු අනුපාත*

*(නියෝග 4(අ), 7, 8)*

| *වර්ෂය* | *කාල සීමාව* | *එක් දුරකථන අංකයක් සඳහා අය කිරීම මාසයක් සඳහා ඇ.ඩො.* | *මාසයක් තුළ මිනිත්තු 1500 ඉක්ම වූ විට ගාස්තුව ඇ.ඩො. ශත* |
|---|---|---|---|
| 2011 | 01.01.2011 - 31.12.2011 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 1.50 |
| 2012 | 01.01.2012 - 31.12.2012 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 1.50 |
| 2013 | 01.01.2013 - 31.12.2013 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 1.50 |

10. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ I උපලේඛනයේ "විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (වි.සං.සං.ගා.) වශයෙන් වූ බදු බෙදා හැරීමේ අනුප්‍රමානය" ඇ වගුවට පසුව බලාත්මක වන පරිදි පහත සඳහන් ඈ වගුව ඇතුළත් කෙරේ.

*වගුව ඈ*

*යන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණ*

| *වර්ෂය* | *කාල සීමාව* | *එක් මිනිත්තුවක් සඳහා අය කිරීම ශ්‍රී ලංකා රුපියල්* |
|---|---|---|
| 2011 | 01.01.2011 - 31.12.2011 | 2.00 |
| 2012 | 01.01.2012 - 31.12.2012 | 2.00 |
| 2013 | 01.01.2013 - 31.12.2013 | 2.00 |

11. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගයේ දෙවැනි උපලේඛනයේ "හුවමාරු ඇමතුම්" වගුවට පසුව බලාත්මක වන පරිදි පහත සඳහන් වගු ඇතුළත් කෙරේ.

II වන උපලේඛනය

*විශේෂිත දුරකථන අංක සම්බන්ධතා*

| *ඇමතුම් අවසාන වූ ජාලයේ ක්‍රියාකරු* | *සම්බන්ධ වූ මුළු විශේෂිත දුරකථන අංක* | *සම්පූර්ණ පිවිසුම් මිනිත්තු ගණන* |
|---|---|---|
| අ ක්‍රියාකරු | | |
| ආ ක්‍රියාකරු | | |

| *ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු (ජා.වි.සං.ක්‍රි.)* | *සම්බන්ධ වූ මුළු විශේෂිත දුරකථන අංක* | *සම්පූර්ණ පිවිසුම් මිනිත්තු ගණන* |
|---|---|---|
| අ ක්‍රියාකරු | | |
| ආ ක්‍රියාකරු | | |

12-289

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.